# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

### ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි දෙවන පරීක්ෂණය (බාහිර) - 2021

2024 අගෝස්තු

### මානවශාස්ත්‍ර පීඨය

## බෞද්ධ සංස්කෘතිය

**බෞද්ධ සමාජ චින්තාව, උපදේශනය හා පූජා චාරිත්‍ර BUCU – 28224**

කොටස් දෙකෙන්ම ඇතුළත් වන සේ ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි. කාලය : පැය 03 යි.

---

1 කොටස

01. සමාජ චින්තාවේ විෂයක්ෂේත්‍රය හා කාර්යභාරය පිළිබඳ ප්‍රමාණවත් විවරණයක් සපයන්න.

02. සමාජ සංස්ථාවන්ගේ ප්‍රභවය හා විකාශය පිළිබඳ බෞද්ධ විග්‍රහයට පාදක වී ඇති පරිණාම ආකල්පය සකාරණව පහදන්න.

03. ජන්මීය සාධක මත මිනිස් වර්ගයා වර්ගකිරීම විචාරයට ලක්කරන බෞද්ධ සමාජ චින්තාව ඒ සඳහා ආධ්‍යාත්මික පරිණතිය පාදක කරගනු ලබන අයුරු පරීක්ෂා කරන්න.

04. මිනිසාගේ පරමාධිපත්‍යය අර්ථවත් කිරීමෙහි ලා මානව ශක්‍යතාවේ භාවිතය ඉවහල් වන අයුරු මූලාශ්‍රයානුසාරයෙන් පහදන්න.

05. ආර්ථික සම්පත් උපාර්ජනයෙහි ලා බෞද්ධ ආර්ථික චින්තාව අනුදක්නා ක්‍රමවේදය කවරේදැයි මූලාශ්‍රයානුසාරයෙන් ප්‍රකට කරන්න.

11 කොටස

06. මානව පෞරුෂය ආශ්‍රිත ගැටලු විශ්ලේෂණයෙහි ලා බුද්ධානුශාසනා ඉවහල් කරගත හැකි අයුරු විභාග කරන්න.

07. බෞද්ධ භාවනාව අර්ථකථනය කරමින් මානසික සෞඛ්‍ය සංරක්ෂණ විධික්‍රමයක් ලෙස එහි උපයෝගීතාව කවරේදැයි විමසන්න.

08. අන්තර්පුද්ගල සබඳතා බිඳවැටීම කෙරෙහි ඉවහල්වන හේතු සාධක කවරේදැයි බෞද්ධ මූලාශ්‍රය ඇසුරින් විස්තර කරන්න.

09. පූජාචාරිත්‍ර පිළිබඳ මුල් බුදුදහමේ ස්ථාවරය පිළිබඳ ප්‍රමාණවත් විවරණයක් සපයන්න.

10. ආගමික හැඟීම් මෙන්ම සංස්කෘතික ආකල්ප සන්නිවේදන මාධ්‍යයක් ලෙස බෞද්ධ සමාජයේ ප්‍රචලිත උත්සව හා පෙරහැර භාවිත වන අයුරු විමර්ශනය කරන්න.

********************************